**සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 12) 88 ඡේදයට අනුව, එකතු කළ අගය මත බදු තක්සේරු කිරීම් සම්බන්ධයෙන්, 2017/2018 සහ 2018/2019 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු අතිරේක බදුවලට අදාළව රු.287,139,348 ක් සහ ඊට අදාළව ගෙවිය යුතු දඩ රු.220,628,092 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ලැබී ඇති එකතු කළ අගය මත බදු තක්සේරුව සඳහා වූ අභියාචනා සමඟින් ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) විසින් සංශෝධිත වැට් බදු වාර්තා 04ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා සාකච්ඡා සිදුවෙමින් පවතී. බදු උපදේශකවරයාගේ සහාය ඇතිව 2022/06/06 දින පළමු රැස්වීම සාර්ථකව සිදු කරන ලදී.<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව අවශ්‍ය නම්, ඉදිරි මූල්‍ය වර්ෂයේදී හෙළිදරව් කිරීම් කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

#### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගල් අඟුරු ආනයනය කිරීමේදී, රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කර ගැනීමේ සංකේතාත්මක ගැලපුමක් ලෙස ඇත්ත වශයෙන්ම සිදු නොවූ, රේගුවේ වටිනාකම සඳහා පිරිවැයට සියයට 10 ක ආන්තිකයක් එකතු කරන ලදී. සමාගම විසින් රු.5,324,423,778 ක් වූ පිරිවැය මත සියයට 10 ක ආන්තිකයක් ආදායමට එකතු කර ඇති අතර පසුව සමාගම ණය ගැතියන්ට එම වටිනාකම වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම් සමාන ප්‍රමාණයකින් අධිගණනය වී තිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලය වෙත වැට් බදු ඉන්වොයිසි නිකුත් කිරීමේදී රේගු ආන්තිකය පිරිවැයට එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් LCC වෙත මග පෙන්වීමක් ලබා දෙන ලදී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජූනි 28 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ යාන්ත්‍රණය අනුගමනය කරන ලදී. දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරියා වාර්තා සහ සටහන් කර ඇති ආකාරයට ලංකා විදුලිබල මණ්ඩලයට ලැබෙන ඉන්වොයිසි මත LCC හි වැට් බද්ද සඳහා පදනම් වන වටිනාකම රේගු අරමුණු සඳහා වන වටිනාකමට වඩා අඩු විය නොහැකි බව පවසා ඇත.<br>එබැවින් 10% එකතු කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියාගේ මග පෙන්වීම මත පමණි. ලංකා විදුලිබල | මෙම කාරණය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) උපදේශය ලබාගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | මණ්ඩලය විසින් එම මග පෙන්වීම අභියෝගයට ලක් කර දේශීය ආදායම් (IR) වෙත 2018.09.07 දිනැති ලිපිය මගින් ලියා ඇති අතර එයට ප්‍රතිචාරය තවමත් ලැබී නොමැත. | |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබී ඇති තොරතුරුවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි වටිනාකම ප්‍රකාශ නොකිරීම හේතුවෙන් සමාගම රු.205,000,000 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට ගෙවා ඇති බව නිරීක්ෂණය විය. 2019 වසරේ සිදු කරන ලද දඩ මුදල් ගෙවීම, අදාළ වර්ෂවල වියදම් ලෙස ගණන් නොගෙන ඒ වෙනුවට ශ්‍රී ලංකා රේගු ගෙවිය යුතු වැට් බදු ගිණුම, වැට් පාලන ගිණුම සහ ලංකා නැව් සංස්ථාව (CSCL) වගකීම් ගිණුම යටතේ ගිණුම්ගත කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රඳවාගත් ඉපැයීම් රු.205,000,000 කින් වැඩියෙන් දක්වා ඇති අතර, සමාලෝචන වර්ෂය යටතේ ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ CSCL වගකීම් ගිණුම පිළිවෙලින් රු.158,186,165, රු.39,970,418 සහ රු.6,843,417කින් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ප්‍රකාශ කර නොමැත. එම කාලය තුළ, ලංකා නැව් සංස්ථාව (CSC) විසින් රේගු ප්‍රකාශනයන් සම්පූර්ණයෙන්ම හසුරුවන ලද අතර එක් නැව්ගත කිරීමකට රු. 1,000,000 සහ ශ්‍රී ලංකා රේගුව විසින් ඉහත වැරදි ප්‍රකාශය මත LCC වෙත රු. 205,000,000 ක දඩ මුදලක් පනවා තිබුණි. මෙම ගෙවීමෙන් පසු අවසන් වැට් බදු ගෙවීමක් සිදු නොකරන ලෙස ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් LCC නිලධාරීන්ට දන්වා තිබුණි.<br>ලංකා විදුලිබල මණ්ඩලය මේ වන විට LCC වෙත ගෙවිය යුතු ඉහත සඳහන් කළ ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින අතර එය නුදුරු අනාගතයේ දී අවසන් කිරීමට නියමිතය. තවද LCC විසින් ඉහත වැරදි ප්‍රකාශය හේතුවෙන් සැබෑ දඩ මුදල රු.6,843,417.00 හඳුනාගෙන CSC වගකීමට එරෙහිව හර කර ඇත. | සමාගම මෙම ගෙවීම දණ්ඩන වියදම් ලෙස සටහන් කළ යුතු අතර මෙම ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේදී සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය සහ ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු බවට ලංකා නැව් සංස්ථාව විසින් තහවුරු කරන ලද ශේෂය අතර රු.4,003,372 ක හඳුනානොගත් වෙනසක් තිබුණි. කෙසේ වෙතත්, එම වෙනස සැසඳීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | LCC සහ CSC 2021 දෙසැම්බර් 31 වන විට වසර අවසාන ශේෂයන් හි පවතින වෙනස්කම් සහ හඳුනානොගත් වෙනස්කම් විසඳීමට සාකච්ඡා කරමින් සිටී. | සමාගම හඳුනා නොගත් වෙනස හඳුනාගෙන ඒ අනුව වාර්තා කළ යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැව්ගත කිරීමේ අංක 123 සඳහා සමාගම විසින් රු.136,236,370 ක් රේගු වැට් බද්ද ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගු ප්‍රකාශනය අනුව සත්‍ය වැට් බද්ද රු.106,969,404ක් පමණක් විය. ඒ අනුව සමාගම රු.29,266,965 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | ලංකා නැව් සංස්ථාව විසින් කරන ලද වැරදි ප්‍රකාශනයක් හේතුවෙන් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම නැව්ගත කිරීමේ අංක 123 සඳහා ශ්‍රී ලංකා රේගුවට රු. 29,266,966 ක වැට් බද්දක් වැඩිපුර ගෙවා ඇත. LCC විසින් දැනටමත් මුදල් ආපසු අය කර ගැනීමේ ඉල්ලීමක් ගොනු කර ඇති අතර ආපසු අය කර ගැනීම සම්පූර්ණ කිරීමට හෝ LCC හි හිඟ රේගු ශේෂයන්ට එරෙහිව හිලව් කිරීමට රේගු දෙපාර්තමේන්තුව සුදුසු විධිවිධාන මත කටයුතු කරමින් සිටී. ආපසු අය කර ගැනීමේ හිමිකම් පෑම විසඳන තෙක් LCC විසින් CSC හි හිඟ මුදලට සමාන මුදලක් රඳවා ගෙන ඇත. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සමඟ සාකච්ඡා කිරීමෙන් පසු සමාගම වහාම ගැටලුව විසඳා ගත යුතුය. |

### 1.5.6 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 154 නැව්ගත කිරීම් අවිනිශ්චිත ගිණුමේ රු. 33,317,325 ක ශේෂයක් පියවීමට සහ ප්‍රසම්පාදන - ගල් අඟුරු සඳහා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු අත්තිකාරම් ගිණුමට අදාලව රු.1,760,500 ක ශේෂයක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | <u>අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂයේ අඩංගු වන්නේ</u>:<br>විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.4,323,787.00 : 2017 වර්ෂයේදී ලංවිම සමඟ ගිණුම පියවීමෙන් පසු ඉතිරි වූ මුදල. මූලාශ්‍රය/මූලාරම්භය සොයා ගැනීමට තවදුරටත් විමර්ශනය කෙරේ.<br><br><u>2021 වර්ෂයේදී මාරු කළ මුදලෙහි අඩංගු වන්නේ: රු.30,757,506</u><br>මර්කේටර් වෙත ගෙවිය යුතු මුදල ගිණුම්කරණයේ ප්‍රතිඵලයක් විය. ඒ වන විටත් අදාළ මුදල විදුලිබල මණ්ඩලයෙන් ලැබී තිබුණත් එය ගිණුම්වල පිළිබිඹු නොවීම නිසා එය අවිනිශ්චිත ගිණුමට හරකර තබාගෙන ඇත. 2022 මූල්‍ය වර්ෂයේ අවිනිශ්චිත ගිණුම ඉවත් කිරීම සඳහා මූලාශ්‍රය/මූලාරම්භය සොයා ගැනීමට තවදුරටත් විමර්ශනය කෙරේ. | සමාගම විසින් ශේෂයන්ගේ මූලාරම්භය තහවුරු කර ගත යුතු අතර, අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |

### 1.5.7 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.22,502,205 ක් වු කළමනාකරණ ගාස්තු වසර 3 කට වැඩි කාලයක සිට හිඟ ව පැවතුනි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් කිසිදු වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි. | 2020 ජුනි 17 වන දින ලක් විජය විදුලි බලාගාරයේ (LVPP)විදුලි බලාගාර කළමනාකරු කාර්යාලයේ පැවති රැස්වීමට අනුව, අතිරේක සාමාන්‍යාධකාරි (උත්පාදන) [AGM (G)] LCC විසින් 2016, 2018 සහ 2019 වර්ෂ සඳහා ලැබිය යුතු හිඟ කළමනාකරණ ගාස්තු සඳහා "සියලු වියදම් කළේ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගණුදෙනුවලට" බව පවසමින්, සාධාරණීකරණ ලිපියක් එවන ලෙස ඉල්ලා සිටියේය. ඉහත සඳහන් ලිපිය යැවීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම හිඟමුදල් පියවනු ඇත. | සමාගම දිගුකාලීන හිඟ ලැබිය යුතු මුදල් සඳහා වෙන්කිරීමක් සිදුකල යුතුය. |

### 1.5.8 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ දී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වැට් සහ අනෙකුත් ලැබිය යුතු මුදල් රු.197,452,711 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. ඒ අනුව, එම මුදල්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | LCC විසින් 2021 වර්ෂය අවසාන විගණනය සඳහා රු.197,452,711 ට සමාන අවසාන වැට් බද්ද සහ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් තහවුරු කිරීමක් ඉල්ලා සිටි නමුත් මූල්‍ය ප්‍රකාශන අවසන් කරන විටත් ඔවුන් විසින් තහවුරු කර නොතිබුණි.<br>දැනට පවතින කළමනාකරණ සාකච්ඡා මත පදනම්ව නුදුරු අනාගතයේ දී අවසන් කිරීමට නියමිත ඉහත සඳහන් ගෙවිය යුතු මුදල පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය දැනට කටයුතු කරමින් සිටී. | සමාගම ලංකා විදුලිබල මණ්ඩලය සමග සාකච්චා කර වහාම ගැටළුව විසඳා ගත යුතුය. |
| (ආ) | විවිධ ණය ගැතියන් වු රු.18,075,801 ක්, පුද්ගලික සමාගමකින් ලැබිය යුතු මුදල් රු.1,115,987 ක්, එම පුද්ගලික සමාගමේම වෙළඳ ණය හිමියන්ගේ ශේෂය රු. 85,887,776 ක් සහ වෙනත් පුද්ගලික සමාගමකින් ලැබිය යුතු සියයට 50 ක SGS ගාස්තුව වූ රු.8,048,531 ක් සත්‍යාපනය කිරීමට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ අනෙකුත් අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත්ව නොතිබුණි. | i. විවිධ ණය ගැතියන් රු.18,075,802<br>මූලික විමර්ශනවලින් හෙළි වූයේ එම මුදල ආපසු අයකරගත නොහැකි NBT සහ PAL හි රු.17,839,949 කින් සමන්විත වන බවයි.<br>මූලාශ්‍රය / මූලාරම්භය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ. | සමාගම ලැබිය යුතු ශේෂවල මූලාශ්‍ර සොයා බලා ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතු අතර ණයහිමියන්ගේ ශේෂයන් තහවුරු කරගෙන අවශ්‍ය දේ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ii ලැබිය යුතු මුදල් - රු.1,115,987<br>නොබෙල් රෙසෝර්සස් (Noble Resource) සඳහා රු.85,887,776 ක ණයහිමි ශේෂයක් ඇති අතර අපි මෙම ණයගැති ශේෂය ඊට එරෙහිව හිලව් කරන්නෙමු.<br><br>iii. වෙළඳ ණයහිමියන්-රු.85,887,776<br>ශේෂය ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ ණයවර ලිපිවල (LC) වලංගු කාලසීමාව අවසන් වීම හේතුවෙන් ණයහිමියා විසින් අඩුවෙන් ලබා ගන්නා ලද වට්නාකමකි .<br><br>iv. ලැබිය යුතු 50% වූ SGS ගාස්තු රු.8,048,531<br>2015/16 වාරයේ නැව් අංක 17 සඳහා ගොඩබාන වරායේදී නැව් තොගයේ බර මිණුම්කරණ ගාස්තු ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු රු.2,362,129 ක ශේෂයකට අදාළ ශේෂය තහවුරු කිරීම් සහ අනෙකුත් අදාළ ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලය අභ්‍යන්තර විගණන ශාඛාව විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව ගෙවිය යුතු ගිණුම්, 2018 සහ ඊට පෙර වර්ෂවල සිදු කරන ලද වැරදි ගිණුම්කරණ සටහන් හේතුවෙන් සිදුවී ඇත.<br>ලංකා විදුලිබල මණ්ඩලය අභ්‍යන්තර විගණන ශාඛාව විසින් කරන ලද නිර්දේශයන්ට අනුකූලව ඉහත දෝෂය නිවැරදි කිරීම සඳහා අපි නිවැරදි කරන ලද සටහන් සිදු කරන්නෙමු. | විගණන නිරීක්ෂණයට ඇතුළත් නොවූ ගෙවිය යුතු ශේෂයක් පිළිබඳව කළමනාකාරිත්වය අදහස් දක්වා තිබූ අතර සමාගම විසින් ශේෂයේ මූලාරම්භය සොයා බැලිය යුතුය. |
| (ඇ) | සීමාසහිත ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම (TISCL) වෙතින් සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) හරහා ලැබිය යුතු රු.539,192,079 ක දිගුකාලීන හිඟ ශේෂයක් අයකර ගැනීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදන වෙන් කිරීම් කර නොතිබුණි. තවද, TISCL/CSCL විසින් නියමිත ශේෂය තහවුරු කර නොතිබුණි. එබැවින් ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | ඉහළ මට්ටමේ කමිටුවක් විසින් ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් බේරුම්කරණය හසුරුවන ලදී. කමිටුව ණය බොල් ණය ලෙස තීරණය කර නොමැති අතර ගල් අඟුරු ලබා දීමෙන් ණය පියවීමට ගැනුම්කරු එකඟ වී ඇත.<br>අපට ලැබී ඇති තොරතුරු අනුව බේරුම්කරණ යෝජනාව සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. ලංකා නැව් සංස්ථාවෙන් (ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම) ලැබිය යුතු හිඟ මුදලේ වත්මන් තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, එහිදී සීමාසහිත ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සමඟ සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය බලාගාරය ,ලංකා ගල් අඟුරු සමාගම යන සිව් පුද්ගල කමිටුවක් පත් කර ඇත.තවද, කමිටු නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය හරහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙසද අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇති අතර එය මෙතෙක් සිදු කර නොමැත. | අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට සමාගම පියවර ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා ගල් අඟුරු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 24 හි හෙළිදරව් කර ඇති පරිදි ලැබිය යුතු ලෙස ලංකා නැව් සංස්ථාව විසින් තහවුරු කරන ලද ශේෂය අතර වෙනස තුළ ඇතුළත් රු.141,097,264 ක් වූ දිගුකාලීන හිඟහිටි ශේෂයන් සමාගම විසින් නිරවුල් කර නොතිබුණි. | බොහොමයක් විෂමතා සාධාරණ සලකා බැලීම් මත LCC විසින් ගිණුම්ගත කර නොමැති අතර සටහන් අංක 24 "අසම්භාව්‍යතා සහ බැදීම්" යටතේ හෙළිදරව්කර ඇත. LCC සහ CSC වසර ගණනාවක් තිස්සේ පවතින එම විෂමතා විසඳීම සඳහා අඛණ්ඩ සාකච්ඡා පවත්වයි. | දීර්සකාලීන හිඟ ශේෂවල විෂමතා නිරවුල් කර ඒ අනුව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.1,340,681 ක දිගුකාලීන සමුච්චිත හිඟ ලැබිය යුතු වැට් ශේෂය සඳහා හිමිකම් පෑමට සමාගම ක්‍රියා කර නොතිබුණි. | IRD වෙත ගෙවිය යුතු නිමැවුම් වැට් බද්දෙන් අපට අඩු කළ හැකි දේශීය මිලදී ගැනීම්වලට අදාළ යෙදවුම් වැට් බදු ප්‍රමාණය මෙයයි. අපි එය වැට් පාලන ගිණුමේ ශේෂයෙන් අඩු කිරීමෙන් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල එය හෙළිදරව් කළෙමු. LCC විසින් 2020 ජුනි 30 දිනෙන් අවසන් වූ දෙවන කාර්තුව දක්වා IRD වෙත ගෙවිය යුතු වැට් බද්ද 2022 මාර්තු 30 වන විට ගෙවා ඇති අතර, අපි ඊට අනුරූප යෙදවුම් වැට් බද්ද වැට් පාලන ගිණුමට මාරු කර ඇත. | ලැබිය යුතු ශේෂයන් සඳහා හිමිකම් පෑමට සමාගම ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගම විසින් අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන රු.1,958,534 ක ප්‍රසාද දීමනාවක් සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණි. | සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ (LCC) වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කරනු ලබන බැවින් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් විරෝධතාවක් නොමැති බවට ලිපියක් ලබා ගැනීමට යටත්ව ප්‍රසාද දීමනාවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දීඇති අතර, තවද මෙය ලංකා විදුලිබල මණ්ඩලයට අමතර වියදමක් නොවන අතර 2020 වර්ෂයේදී ද එම ක්‍රියා පටිපාටියම අනුගමනය කර ඇත. | සමාගම චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව අවම වශයෙන් වසර තුනක් සඳහා අපේක්ෂා කරන ලද ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් සකස් කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අනුමත කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 113 වගන්තියට අනුකූල නොවන පරිදි 2017/2018 තක්සේරු වර්ෂය සඳහා සමාගම විසින් සිදු කරන ලද බදු ගෙවීම් සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් රු.113,089 ක දඩයක් පනවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 12) 88 වැනි ඡේදයට අනුව දඩ මුදල 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා IRD වෙත ගෙවා හෝ ඒ පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. | අප විසින් සියලුම ආදායම් බදු නියමිත වේලාවට ගෙවා ඇති අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවන ලද රු.113,089 අතිරේක දඩය අප පිළිගෙන නොතිබුණි. මෙම ගැටළුව සාමකාමීව විසඳා ගැනීමට අප විසින් අභියාචනයක් සිදු කර ඇත. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර සමාගම වහාම ගැටලුව විසඳා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 වර්ෂයේ සිට සමාගම විසින් දරනු ලැබූ ශුද්ධ පොදුකාර්ය පිරිවැය ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීම හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය පෙර වර්ෂයට අනුව බදු පෙර ශුද්ධ ලාභයක් හෝ ශුද්ධ අලාභයක් නොවිය.

## 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස වැඩි වීම හෝ අඩු වීම සමඟ විශ්ලේෂණය පහත පරිදි වේ.

| ආදායම/වියදම | 2021<br>රු. | 2020<br>රු. | ඉහලයාම/(පහලයාම)<br>රු. | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ආදායම | 59,046,036,553 | 41,000,383,219 | 18,045,653,334 | 44 |
| විකුණුම් පිරිවැය | 58,990,572,660 | 40,954,618,074 | 18,035,954,586 | 44 |
| පරිපාලන වියදම් | 60,718,556 | 53,836,714 | 6,881,842 | 12.8 |

ගල් අඟුරු මිල ඉහළ යාම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම සහ විකුණුම් පිරිවැය පිළිවෙලින් රු.18,045,653,334 සහ රු.18,035,954,586 කින් ඉහළ ගොස් ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබූ අතර වත්කම් ලැයිස්තුවක් මයික්‍රොසොෆ්ට් එක්සෙල් (MS Excel) ලේඛනයක පවත්වාගෙන යනු ලබන අතර එය අනවසර වෙනස් කිරීම් අවදානමට ලක්විය හැකිය. | 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ප්‍රකාරව භාණ්ඩාගාරයේ සහ විදුලිබල අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන්ට අනුව සෑම වසරක් අවසානයේදීම සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් සියලුම ස්ථාවර වත්කම් සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වයි. විගණන නිරීක්ෂණවලදී හඳුනාගත් එවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන පරිදි විදුලි උපකරණවල අනුක්‍රමික අංක ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස බලයලත් නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර ස්ථාවර වත්කම් පවත්වාගෙන යාමේදී සුදුසු අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දිය යුතුය. |